සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

7 ශ්‍රේණිය | **භූගෝල විද්‍යාව** | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරු අක්ෂාංශ අංශක 23.5 රේඛාව .................................. නිවර්තනය ලෙස හඳුන්වයි. (මකර / ආක්ටික් / කර්කටක)

02 ආසන්න වටපිටාවේ ඇති ගොඩබිම් හා සාගර පදනම් කරගෙන රටක පිහිටීම දැක්වීම .................................. පිහිටීම ලෙස හඳුන්වයි. (සාපේක්ෂ / නිරපේක්ෂ / නිශ්චිත)

03 අසනි වැසි ලෙස හඳුන්වන්නේ ...................................... වර්ෂාවයි. (වාසුළි / සංවහන / නිරිතදිග මෝසම්)

04 මුහුදු මට්ටමේ සිට 300m ට වඩා උසින් වැඩි ප්‍රදේශ ............................................ භූ දර්ශනයට අයත් වේ. (වියළි කලාපීය / තෙත් කලාපීය / කඳුකර)

05 අලංකාර කොරල්පර සහිත .......................................... ප්‍රදේශය සංචාරකයින්ගේ ආකර්ශනයට ලක්ව තිබේ. (හික්කඩුව / නිලාවේලි / උණවටුන)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 පෘථිවි ආදර්ශ ගෝලයේ තිරස් අතට හරි මැදින් වැටී ඇති රේඛාව සමකය වේ. ( )

07 ලෝකයේ කුඩාම මහාද්වීපය වන ඕස්ට්‍රේලියාව තනි රටක් ලෙස පවතී. ( )

08 කැස්පියන් මුහුද අප්‍රිකා මහාද්වීපය තුළ පිහිටා ඇත. ( )

09 මැයි, ජූනි මාසවල ඊසානදිග මෝසම් මගින් ශ්‍රී ලංකාවට වැසි ලැබේ. ( )

10 උතුරු ප්‍රදේශයේ ඇති නයිනතිව් දූපත ආගමික වැදගත්කමක් ඇති දූපතකි. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

11 ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට .................................................. තුඩුව දක්වා දිග 432km කි.

12 දකුණු ආසියානු කලාපයට අයත් රටවල් අතරින් විශාලම රට ........................................................................ යි.

13 පෘථිවි ආදර්ශ ගෝලයේ උත්තර ධ්‍රැවයේ සිට දක්ෂිණ ධ්‍රැවය දක්වා විහිදෙන මනඃකල්පිත රේඛා ............................................................ ලෙස හැඳින්වේ.

14 වියළි කලාපයේ කුඩා හෙල්වැටි අතරින් ගලාබසිනා ගංගා හරස් කර .................................................. ඉදිකර තිබේ.

15 යාපන අර්ධද්වීප ප්‍රදේශයේ බහුලව දක්නට ඇති වෘක්ෂය වන්නේ ........................................................ ගසයි.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16 ලෝකයේ ප්‍රධාන සාගර අතරින් කුඩාම සාගරය වන්නේ මින් කුමක් ද?

(1) ඉන්දියන් සාගරය (2) පැසිපික් සාගරය

(3) ආක්ටික් සාගරය (4) ඇන්ටාක්ටික් සාගරය

17 දේශාංශ $180^{o}$ රේඛාව හඳුන්වන නම මින් කුමක් ද?

(1) ග්‍රිනිච් රේඛාව (2) කර්කටක නිවර්තනය

(3) සමකය (4) ජාත්‍යන්තර දින රේඛාව

18 කඩොලාන ශාක බහුලව දැකිය හැකි වන්නේ මින් කවර ප්‍රදේශවල ද?

(1) කලපු හා මෝය ආශ්‍රිතව (2) සානු හා දියඇලි ආශ්‍රිතව

(3) නිම්න හා ගංගා ආශ්‍රිතව (4) වැව් හා ජලාශ ආශ්‍රිතව

19 ශ්‍රී ලංකාවට බලපාන වාසුළි ක්‍රියාත්මක වන කාලසීමාව මින් කුමක් ද?

(1) මාර්තු, අප්‍රේල් (2) නොවැම්බර්, දෙසැම්බර්

(3) මැයි, ජුනි (4) ජූලි, අගෝස්තු

20 පහත සඳහන් ස්ථාන අතරින් නිදහස් වෙළඳ කලාපයක් පිහිටා ඇත්තේ කවර ස්ථානයේ ද?

(1) ඒකල (2) මාතර (3) බියගම (4) මීගමුව

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

(01) (අ) පහත සඳහන් ලෝක ආකෘති සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති තොරතුරු දක්වන්න.




(i) A අක්ෂරයෙන් දැක්වෙන ලොව විශාලම දූපත (ල. 01)

(ii) B අක්ෂරයෙන් දැක්වෙන මුහුද (ල. 01)

(iii) අත්ලාන්තික් සාගරය දැක්වෙන අක්ෂරය (ල. 01)

(iv) F අක්ෂරයෙන් දැක්වෙන ප්‍රධාන අක්ෂාංශ රේඛාව (ල. 01)

(v) නැගෙනහිර දේශාංශ 80° රේඛාව දැක්වෙන අක්ෂරය (ල. 02)

(vi) E හා F රේඛා දෙක අතර පිහිටි දේශගුණික කලාපය (ල. 02)

(ආ) යාබද ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති තොරතුරු දක්වන්න.




(i) සංගමන්කන්ද තුඩුව දැක්වෙන අක්ෂරය (ල. 01)

(ii) B අක්ෂරයෙන් දැක්වෙන දූපත (ල. 01)

(iii) කඳුකර භූ දර්ශනයට අයත් දිස්ත්‍රික්කයක් දැක්වෙන අක්ෂරය (ල. 01)

(iv) සේයා කර ඇති අර්ධද්වීපය (ල. 01)

(v) G අක්ෂරයෙන් දැක්වෙන මෝසම් සුළං වර්ගය (ල. 02)

(vi) H අක්ෂරයෙන් දැක්වෙන අක්ෂාංශ රේඛාවේ වටිනාකම (ල. 02)

02 යාබද ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) සිතියමේ A, B හා C අක්ෂරවලින් දැක්වෙන්නේ රියෝද ජැනයිරෝ, සැන්ප්‍රැන්සිස්කෝ හා කයිරෝ යන නගරයන් ය. ඒවා A, B හා C පිළිවෙලින් නම් කරන්න. (ල. 03)

(ii) ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි දූපත් තුනක් නම් කරන්න. (ල. 03)

(iii) සිතියමේ අංක 1 සිට 5 දක්වා ඇති රටවල් පිළිවෙලින් නම් කරන්න. (ල. 05)

03 රටක පිහිටීම ප්‍රකාශ කළ හැකි ක්‍රම දෙකකි.

(i) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ලැබී ඇති වාසි දෙකක් ලියන්න. (ල. 02)

(ii) (a) නිරපේක්ෂ පිහිටීම යනු කුමක් ද? (ල. 02)

(b) ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම දැක්වෙන පහත සටහනේ හිස්තැන් පුරවන්න.

ශ්‍රී ලංකාව උතුරු අක්ෂාංශ (1) .................................. හා $9^{o}\ 51^{/}$ අතර ද (2) ............................ දේශාංශ $79^{o}\ 41^{/}$ හා (3) ................................ අතර ද පිහිටා ඇත. (ල. 03)

(iii) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පහත දිශාවන්ට අනුව දක්වන්න.

1. උතුරින්
2. දකුණින්
3. නැගෙනහිරින්
4. බටහිරින් (ල. 04)

04 දකුණු ආසියා කලාපය තුළ සමාජයීය සංවර්ධනය අතින් ශ්‍රී ලංකාව විශේෂ තැනක් හිමිකරගෙන තිබේ.




(i) දකුණු ආසියාවේ ඉහළම සමාජයීය සංවර්ධනයක් ඇති රටවල් දෙක නම් කරන්න. (ල. 02)

(ii) යාබද දකුණු ආසියා සිතියමේ A, B හා C වලින් දැක්වෙන රටවල් නම් කරන්න. (ල. 03)

(iii) ආහාර, සෞඛ්‍යය හා අධ්‍යාපන අංශවල සංවර්ධනය නිසා ශ්‍රී ලංකාව අත්කරගෙන ඇති වාසි ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 06)

| | | |
|---|---|---|
| පෝෂ්‍යදායී ආහාරවේලක් ලබාගත හැකිවීම | ⟹ | 1. ............................................<br>* කායික හා මානසික පෝෂණය වැඩිවීම<br>2. ............................................ |
| වෛද්‍ය හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පහසුකම් වැඩිදියුණු වීම | ⟹ | 3. ............................................<br>4. ............................................<br>* මාතෘ මරණ අඩුවීම |
| අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු වීම | ⟹ | 5. ............................................<br>* ජීවන මට්ටම ඉහළයාම<br>6. ............................................<br>* සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට පෙළඹීම |

05 ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක් අයත්වන්නේ වියළි කලාපීය භූ දර්ශනයට යි.

(i) ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය දැකිය හැකි පළාත් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) වියළි කලාපීය භූ දර්ශනයේ පදනම සකස්වීමට බලපා ඇති දේශගුණික සාධක දෙකක් දක්වන්න. (ල. 02)

(iii) වියළි කලාපයේ පවතින භෞතික හා මානුෂ භූ දර්ශනයේ ලක්ෂණ ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 07)

වියළි කලාපීය භූ දර්ශනය

- භෞතික භූ දර්ශනය
  - ශේෂ කඳු
    - 1. ...............................
    - 2. ...............................
  - 3. ...............................
    - යාල
    - 4. ...............................
    - වස්ගමුව
- මානුෂ භූ දර්ශනය
  - 5. ...............................
    - ශ්‍රී මහා බෝධිය
    - 6. ...............................
  - කෘෂිකාර්මික කටයුතු
    - 7. ...............................
    - හේන් ගොවිතැන

(ල. 07)

06 ශ්‍රී ලංකාවේ නිරිත, බටහිර හා මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම්වල තෙත් කලාපීය භූ දර්ශනයක් දැකිය හැකිය.

(i) යාබද සිතියමේ අංක 1 හා 2 න් දක්වෙන තෙත් කලාපයේ සීමාව පෙන්වන ගංගා දෙක නම් කරන්න. (ල. 02)

(ii) (a) සිතියමේ A හා B වලින් දක්වෙන නගර දෙක නම් කරන්න. (ල. 02)

(b) තෙත් කලාපයට බලපාන ස්වභාවික ආපදා දෙකක් ලියන්න. (ල. 02)



(iii) තෙත් කලාපීය භූ දර්ශනයේ ලක්ෂණ කිහිපයක් අංක 1 සිට 5 දක්වා රූප සටහන් වලින් දැක්වේ. ඒවා නිවැරදිව හඳුනාගෙන නම් කරන්න. (ල. 05)


1


2


3


4


5

07 පහත දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

3. ප්‍රධාන සාගරයකි.
5. මාර්තු, අප්‍රේල් මාසවල වැසි ලැබෙන ක්‍රමය
6. උතුරු ප්‍රදේශයේ පිහිටි හින්දු ආගමික සිද්ධස්ථානයකි.
8. කුරුණෑගල-මහනුවර මාර්ගය මෙම දුර්ගය හරහා වැටී ඇත.
9. වියළි කලාපයේ පිහිටි අභයභූමියකි.

<u>පහළට</u>

1. ශේෂ කන්දකි.
2. පෘථිවි ආදර්ශ ගෝලයේ තිරස් අතට ඇඳ ඇති රේඛා
4. තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්කයකි.
7. මිරිදිය මත්ස්‍යයෙකි.
8. බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්කයකි.
10. සාගරය දෙසට නෙරාගිය ගොඩබිම් කොටස




(ල. 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) කර්කටක (02) සාපේක්ෂ (03) සංවහන (04) කඳුකර (05) හික්කඩුව
(06) ✓ (07) ✓ (08) ✗ (09) ✗ (10) ✓ (11) පේදුරු (12) ඉන්දියාව
(13) දේශාංශ (14) වැව් (15) තල් (16) 3 (17) 4 (18) 1
(19) 2 (20) 3

(2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) (i) ග්‍රීන්ලන්තය (ල. 01) (ii) කැස්පියන් (ල. 01) (iii) D (ල. 01)
(iv) මකර නිවර්තනය (ල. 01) (v) G (ල. 02) (vi) නිවර්තන (ල. 02)
(vii) ඊසානදිග (ල. 02) (viii) උ.අ. $7^o$ (ල. 02)

02 (i) A කයිරෝ B සැන්ප්‍රැන්සිස්කෝ C රියෝද ජැනයිරෝ (ල. 03)
(ii) මාලදිවයින / අන්දමන් / නිකොබාර් / සුමාත්‍රා (ල. 03)
(iii) 1. රුසියාව 2. චීනය 3. ඉන්දියාව 4. බ්‍රසිලය 5. මැඩගස්කරය (ල. 05)

03 (i) * සහයෝගිතාව වර්ධනය වීම / නව තාක්ෂණය ග්‍රහණය වීම / ආපදා සහ ත්‍රස්තවාදී ක්‍රියා මැඩලීමට සහය ලබාගැනිම / අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඉක්මනින් ගෙන්වා ගත හැක. ආදී .... (ල. 02)
(ii) (a) අක්ෂාංශ හා දේශාංශ අනුව රටක පිහිටීම දැක්වීම. (ල. 02)
(b) 1. $5^o 55^/$ 2. නැගෙනහිර දේශාංශ 3. $81^o 53^/$ (ල. 03)
(iii) 1. ආසියා මහාද්වීපය 2. ඉන්දියන් සාගරය 3. ගිණිකොනදිග ආසියා රටවල්
4. අප්‍රිකා මහාද්වීපය (ල. 04)

04 (i) ශ්‍රී ලංකාව හා මාලදිවයින (ල. 02)
(ii) A - පාකිස්ථානය B - නේපාලය C - බංග්ලාදේශය (ල. 03)
(iii) 1. ලෙඩරෝගවලට ඔරොත්තුදීමේ ශක්තිය වැඩිවීම.
2. ආයු අපේක්ෂාව වැඩිදියුණු වීම.
3. ආයු අපේක්ෂාව වැඩිවීම.
4. ළදරු මරණ අඩුවීම.
5., 6. සාක්ෂරතාව වැඩිදියුණු වීම / හොඳ රැකියා අවස්ථා ඇතිවීම / යහපත් ආකල්ප ඇතිවීම (ල. 06)

05 (i) උතුර / උතුරු මැද / නැගෙනහිර (ල. 02)
(ii) දැඩි නියඟය / අධික උෂ්ණත්වය / අඩු වර්ෂාපතනය / ඉහළ වාෂ්පීකරණය (ල. 02)
(iii) 1,2 සීගිරිය / දඹුල්ල / රිටිගල / කතරගම ආදී
3. වනෝද්‍යාන (වනාන්තර) / අභයභූමි
4. විල්පත්තු / කුමන / සෝමාවතිය / මාදුරුඔය ආදී
5. ආගමික සිද්ධස්ථාන
6. චෛත්‍ය / මඩු දේවස්ථානය / කෝනේස්වරම් කෝවිල / කතරගම දේවාලය / ඉස්ලාම් දේවස්ථානය වැනි
7. වී වගාව (ල. 07)

06 (i) 1 දැදුරුඔය 2 වළවේ ගඟ (ල. 02)
(ii) (a) A - කොළඹ B - ගාල්ල (ල. 02)
(iii) 1. රබර් වගාව 2. ඇඟලුම් කම්හල් (රෙදි විවීම) 3. අධිවේගී මාර්ග / පුළුල් මාර්ග
4. නාගරික ජනාවාස / තට්ටු ගොඩනැගිලි 5. දුම්රිය මාර්ග (ල. 05)

07 <u>හරහට</u>
3. ආක්ටික් සාගරය 5. සංවහන 6. නල්ලූර් 8. ගලගෙදර 9. විල්පත්තුව
<u>පහළට</u>
1. සීගිරිය 2. අක්ෂාංශ 4. රත්නපුරය 7. දූලා 8. ගම්පහ
10. තුඩුව (ල. 11)